# නාට්‍ය හා රංග කලාව

## විෂය නිර්දේශය

### 6 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකා

2007

# නාට්‍ය හා රංග කලාව

## 6 වන ශ්‍රේණිය

## හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව විෂය මෙතෙක් පැවතුණේ 10,11,12 හා 13 වන ශ්‍රේණි සඳහා පමණි. 2007 වර්ෂයේ සිට ප්‍රථම වතාවට කනිෂ්ඨ ද්විතීයික මට්ටමේ ආරම්භක ශ්‍රේණිය වන සවැනි ශ්‍රේණියට හඳුන්වා දෙනු ලැබ ඇත. මෙම නව ප්‍රවේශය මගින් ළමාවියේ තවත් සුන්දර අවධියක පසු වන දරුවාට පාසලේ දී නිර්මාණාත්මක චින්තනය හා ක්‍රියාකාරකම මත පෞරුෂය ගොඩ නඟා ගැනීමට අත්වැලක් සැපැයේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 10,11 ශ්‍රේණි සඳහා නාට්‍ය හා රංග කලාව විෂය ඇතුළත් කිරීම මගින් එම විෂය දැනුම පමණක් නො ව ඔවුන් ගේ රසවින්දන මට්ටම් හා ආකල්ප වර්ධනයක් ද සිදු වෙමින් පවතී. එසේ ම විෂය කරුණු ලබාදීමට වඩා ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ නිශ්චිත නිපුණතාවන් ඉටුවන පරිදි මෙම විෂය ඉදිරිපත් කෙරේ. ඒ නිසා ම 6 වන ශ්‍රේණිය වැනි ආරම්භක අවධියකින් ඇරැඹ, එය ඉදිරියට යාම තුළ පංති කාමරයේ වඩා ඵලදායි ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි ය. මෙම ශ්‍රේණිවල සිටින දරුවන් ඉගෙන ගන්නා සෙසු විෂයයන්ට අයත් ඉගැනුම් අත්දැකීම් වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා ආකර්ෂණයක් හා ප්‍රබල මාධ්‍යයක් ලෙස ද මෙම විෂයය සැලැකිය හැකි ය. නූතන නිෂ්පාදන ලෝකය තුළ බොහෝ ශ්‍රම කාර්යයන්හි දී මිනිසා නිවැරැදි, වේගවත් හා සකසුරුවම් ලෙස තම චලන ක්‍රියා සිදු කළ යුතු ය. පංති කාමර කේන්ද්‍ර කොට සිසුන්ට ලබාදෙන රංග අභ්‍යාස, රංග ක්‍රීඩා, පරිකල්පන අභ්‍යාස වැනි මෙම විෂයය ක්‍රියාකාරකම්වලින් එවැනි කඩිසර වැඩ ලොවකට ඵලදායි ලෙස සහභාගි වීමට දරුවාට මනා පුහුණුවක් ලැබෙනු ඇත.

ළමාවිය අතිශය සුන්දර අත්දැකීම් වලින් පිරී ඇත. එය අනාගත දිවියට අර්ථවත් පදනමක් සපයයි. ළමාවිය පිරී ඇත්තේ නැටුම් මෙන් ම විචිත්‍ර වූ සිතුවිලි හා වීර ක්‍රියා මාලාවකින් ය. 6,7,8,9, වැනි ශ්‍රේණිවල සිටින මෙම ළමුන් ගේ ලෝකයට නාට්‍ය කලාව විෂයයක් වශයෙන් අලුතින් එක් කිරීම ඇත්තෙන් ම ඔවුන්ගේ අධ්‍යාපන දිවියට ප්‍රියජනක ඉගැනුම් අත්දැකීම් සමීප කරදීමක් පමණක් නොව දරුවන් ගේ සමස්ත පෞරුෂය ගොඩනැඟීමට කදිම අත්වැලක් ද වනු ඇත. එක ම දේශයක දරු කැළක් ලෙස අලුතින් සිතන හා නිර්මාණය කළ හැකි දූ පුතුන් බිහි කරලී ම පුළුල් විෂය මාලාවකින් ඉටු විය යුතු අරමුණ යි. එම අරමුණ නාට්‍ය හා රංග කලාව විෂයය මගින් ද සාක්ෂාත් කරගත හැකිය.

නාට්‍ය හා රංග කලාව විෂයය 6 වන ශ්‍රේණියේ සිට ඇරඹෙන මෙම නව අවස්ථා ගුරු භවතුන් වන ඔබට ද අලුත් අධිෂ්ඨානයක් හා වගකීමක් රැගෙන එන අභියෝගයකි. එනම්, ශ්‍රී ලාංකීය අනන්‍යතාවකින් යුතු සෞන්දර්යාත්මක විඥානය සිසු පරපුර වෙත පවරාදීමේ මහඟු කාර්ය යි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## <u>විෂයයට අදාළ නිපුණතා</u>

01. අත්දැකීම් අනුකරණය, රසවිඳීම හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරයි.

02. නාට්‍යමය ක්‍රියාකාරකම්හි නිරත වෙමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

03. ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරත වෙමින් අදාළ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.

04. නාට්‍ය හා රංග කලාවට අදාළ සංස්කෘතික හා සාමාජික වටපිටාව අධ්‍යයනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම

- මුල, මැද, අග සහිත තමන් දන්නා ජනකතා කථනයෙන් ඉදිරිපත් කරයි.
- පන්ති කාමරය තුළ හා ඉන් බැහැර දී කතාන්දර කියවා වාචික ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසයි.
- ස්වාභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරින් අනුකරණයට යොමු වෙයි.
- මිනිස් ලෝකය තුළ දකින බාහිර චලන ඉරියව් හා හැඬතල අනුකරණය කරයි.
- සත්ත්ව ලෝකය තුළ දකින බාහිර චලන , ඉරියව් හා හැඬතල අනුකරණය කරයි.
- අත්දැකීම් පරිකල්පනය කිරීමේ ශක්තීන් පුබුදුවා නිර්මාණකරණයට යොමු වෙයි.
- පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි ඇසුරින් නිර්මාණාත්මක රංගනක්‍රියා ගොඩනගයි.
- තනි තනි ව නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- සාමූහික ව නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- සතුන් පාදක කොට ගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.
- මිනිසුන් පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.
- ද්‍රව්‍ය පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.
- අවස්ථා පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.
- පරිකල්පන ශක්තීන් පුබුදු වීමට විවිධ නිර්මාණ කාර්යයන්හි යෙදෙයි.
- අත්දැකීම් ඇසුරුකොට සාමූහික ව කතන්දර ගොතයි.
- ජනකතා ඇසුරෙන් පරිකල්පන ශක්තීන් පුබුදුවා නිර්මාණකරණයට යොමු වෙයි.
- අපතේ යන ද්‍රව්‍ය හා ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණ කරයි.
- ජනකථා ඇසුරෙන් රංගන අවස්ථා ගොඩනගයි.
- පැහැදිලි ව අදහස් ප්‍රකාශනය හා අවබෝධයෙන් යුතු ව සංවාදයේ යෙදෙයි. (තෝරාගත් නාට්‍ය පෙළ ඇසුරින්)
- ඒ ඒ චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදෙයි.
- මනස හා ශරීරය අතර සම්බන්ධතාව සරල ව හඳුනාගැනීම සඳහා සංචලන විධි භාවිත කරයි.
- විවිධ ස්වර හා තාලවලට අනුව සංවාද භාවිතා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- විවිධ හැඟීම් හා අවස්ථාවන්ට උචිත පරිදි සංවාද හා දෙබස් භාවිතා කරයි.
- ජනක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදෙයි.
- ජන සාහිත්‍යයේ එන සරල කතා හා ඒවායේ වටපිටාව පිළිබඳ අධ්‍යයනය කරයි.
- ජනකථා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වෙයි.
- ජනකතා, උපමාකතා ආදියෙහි එන සාමාජික හා සංස්කෘතික ලක්ෂණ

  විමසයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේද

ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවේ සිට කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවස්ථාවට අවතීර්ණ වන මුල් ම අවධිය ලෙස සවැනි ශ්‍රේණිය සැලැකිය හැකිය. සිසුවා සමෝධානිත ව ප්‍රගුණ කළ විෂය දැනුම වෙන් වෙන් වශයෙන් හඳුරීමට පෙළැඹෙන්නේ මෙතැන් සිට ය. සිසුවා ගේ නිර්මාණාත්මක චින්තනය හා ක්‍රියාකාරකම් විකසිත කිරීමෙහිලා සෙසු සෞන්දර්යයාත්මක විෂයයන් අතරට ප්‍රථම වරට නාට්‍යය හා රංග කලාව එක්වීම අතිශයින් වැදගත් සංසිද්ධියකි. මෙම විෂයයෙන් අපේක්ෂිත නිපුණතා ලබාදීමේ දී සිසුවාට ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ දැනුම, ආකල්ප හා කුශලතා ලබාදිය යුතු වේ.

- රසාස්වාදය හා විචාරය
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
- සිද්ධාන්ත මූලික ප්‍රායෝගික ක්‍රියාකාරකම්
- සංස්කෘතික පසුබිම

මෙම ක්ෂේත්‍රයන් ප්‍රගුණ කිරීමෙන් අපේක්ෂිත නිපුණතා කරා එළැඹීම සඳහා උචිත නව ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමෝපායයන් යොදාගත යුතු වේ. එම ක්‍රමෝපායයන් පහත සඳහන් පරිදි සිසුවා ගේ නිර්මාණාත්මක බව මෙන් ම සිසු පෞරුෂය ගොඩනැංවීම සඳහා ඉවහල් කරගත හැකි වේ.

1. අවට පරිසරය සම්බන්ධ කොටගත් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්.
2. සාමූහික ක්‍රියාකාරකම්
3. සරල රංග ක්‍රීඩා
4. නාට්‍ය නිර්මාණ නැරැඹීම
5. කතාන්දර ඇසුරු කොටගත් රසවින්දන ක්‍රියාකාරකම්.
6. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
7. නාට්‍යානුසාරී ඉගැන්වීම් .
8. ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක
9. ක්ෂේත්‍ර චාරිකා
10. සංස්කෘතික වැඩසටහන් සඳහා සහභාගි ක්‍රියාකාරකම්
11. සම්පත් පුද්ගලයින් සමග ක්‍රියාකාරී වැඩසටහන්
12. විෂයට අදාළ වර්ණ පින්තූර, පෝස්ටර් ආදිය ගොනු කිරීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## <u>ගුණාත්මක යෙදවුම්</u>

- ❖ මුද්‍රිත කතාන්දර පොත්
- ❖ ජනකතා ( ජාතික අධ්‍යාපන ආයතනය)
- ❖ ශ්‍රී ලංකාවේ ජනකථා එකතුව - එස්.විජේසූරිය
- ❖ ජගත් ජනකථා - ජයන්ත විමලසේන
- ❖ සංයුක්ත තැටි(ළමා වැඩසටහන් සහිත)
- ❖ හඬ පට හා දෘශ්‍ය පට
- ❖ විවිධ කතන්දර
- ❖ පුංචි අපට දැන් තේරෙයි - සෝමලතා සුබසිංහ
- ❖ අමර ගියා දිව්යලෝකෙ - පාලිත ලොකුපෝතාගම
- ❖ ළමා නාට්‍ය පොත්
- ❖ ළමා කතා පොත්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්</u>

සවැනි ශ්‍රේණිය සඳහා අලුතින් හඳුන්වාදෙන නාට්‍ය හා රංග කලාව විෂයය ද්විතීයික මට්ටමේ මුල් අවධියේ පසු වන දරුවාට ලැබෙන මහඟු අවස්ථාවකි. දරුවා ගේ නිර්මාණාත්මක චින්තනය අවධි කරවමින් පන්තිකාමරය ක්‍රියාකාරකම් රැසකින් පුබුදුවාලන්නට එය අත්වැලක් වනු නිසැක ය. 2007 වසරේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ක්‍රියාකාරකම් සැලැසුම් මගින් සිසුවා ගේ විවිධ හැකියාවන් මල්පල ගැන්වීමට හේතු වනු ඇත

විෂය සංවර්ධනයට පාසල් මට්ටමේ මානව හා භෞතික සම්පත් ළඟා කරදීමෙන් ගුරු අත්පොතින් ඔබ්බට ගොස් පන්ති කාමර ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාරවත් හා ඵලදායි කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම වඩාත් ඵලදායක ය.

1. කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන් සඳහා දේශීය හා විදේශීය කතන්දර පොත් ඇතුළත් පුස්තකාල පහසුකම් ඇතිකිරීම.
2. වාර අවසාන නාට්‍ය නිර්මාණ එළි දැක්වීම.
3. සංස්කෘතික උත්සව අවස්ථාවල දී නාට්‍ය අංග ඇතුළත් විවිධ තරග සංවිධානය කිරීම.
4. ළමුන් සඳහා එළිමහන් රංග පීඨයක් පාසල් පරිශ්‍රය තුළ ඉදි කිරීම.
5. රංගෝපකරණ ප්‍රදර්ශනය කිරීමට ක්‍රියාකාරකම් කාමර සඳහා පහසුකම් ලබාදීම.
6. ප්‍රාදේශිය ළමා නාට්‍ය නැරැඹීමට අවස්ථාව ලබාදීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## තක්සේරුකරණය හා ඇගැයීම

සවැනි ශ්‍රේණියේ දී නාට්‍ය හා රංග කලාව විෂය ඉගැන්වීම බොහෝ දුරට ක්‍රියාකාරකම් පාදක ව සිදුවන්නක් බැවින් පන්ති කාමරයේ ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවන්හි දී ම ඊට උචිත නිර්ණායක ඔස්සේ තක්සේරුවට හා ඇගැයීමට ලක් කිරීම සුදුසු ය. එමගින් ළමයින් ගේ විවිධ දක්ෂතා සඳහා උපස්තම්භන ලබාදීම ද කළ යුතු ය.

1. නාට්‍ය හා රංග කලාව විෂය හැදෑරීමේ දී ළමයින් තුළ විවිධ දක්ෂතා මතුවන හෙයින් ඒවා දිරිගන්වන අයුරින් තක්සේරු හා ඇගයීම් ක්‍රම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුතු ය. (උදා: කතාන්දර ගෙතීම, ක්ෂණික නිරූපණ, වෙස්මුහුණු නිර්මාණය කිරීම)

2. විෂය දැනුම මනින ඇගැයීම් ක්‍රමයට සමගාමී ව පසුබිට සිසුන් ගේ පෞරුෂ ලක්ෂණ වර්ධනය වන ආකාරයෙන් ඇගැයීම් නිර්ණායක සකස් කිරීම වැදගත් ය.

3. නාට්‍ය හා රංග කලාව විෂයයේ දී විෂය දැනුමට වඩා ඇගැයීම මගින් තක්සේරුවට ලක් විය යුතු වන්නේ දරුවා ගේ ප්‍රකාශන ශක්තිය යි. මෙහි දී දරුවා ගේ ආත්මීය ප්‍රකාශන මතු වීමට ඉඩ සැලසීම වැදගත් වේ.

4. වාරයකට නියමිත පාසල් පාදක ඇගැයීම් ක්‍රමය යටතේ සවැනි ශ්‍රේණියට අයත් සිසුන් ගේ වර්ධන මට්ටම්වලට ගැලපෙන හා විෂයයට අදාළ නිපුණතා ලබාගැනීමට ඉවහල් වන ඇගැයීම් ප්‍රභේද තෝරාගැනීම කළ යුතු ය.

5. වාර්ෂික පරීක්ෂණයේ දී ලිඛිත හා ප්‍රායෝගික අංශ දෙක ම නියෝජනය වන ආකාරයට නව ආකෘතියක් ඔස්සේ තක්සේරු කරනු ලැබේ.

   උදා:-

   ලිඛිත ප්‍රශ්න පත්‍රය තුළ විවිධ ප්‍රශ්න අන්තර්ගත කරනු වෙනුවට විෂයානුබද්ධ ඡේදයක් ලබා දී එමගින් විෂය සාධන මට්ටම ඇගැයෙන පරිදි ප්‍රශ්න ගොඩ නඟාගත හැකි ය.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමක දී ම තක්සේරුකරණය හා ඇගැයීම සිදු කිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථාව තක්සේරුකරණයටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදාගත හැකි වේ.

සිසුන් අදාළ කාර්යයේ යෙදෙන අවස්ථාවල දී ඔවුන් සමීප ව නිරීක්ෂණය කරමින් ඔවුන් ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයකුම අවම ප්‍රවණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා ක්‍රියා කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුකරණය නම් වේ. එසේ ම සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවල දී ඔවුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කරමින් හා ප්‍රතිඵල සන්නිවේදනය කරමින් ඇගැයීම් ක්‍රියාත්මක කළ හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සිසු කණ්ඩායම් සමස්ත පන්තිය වෙත සාමූහික ව ඉදිරිපත් කරන අදහස්, ඇගැයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරැදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමට කරණු ලබන ප්‍රයත්න ඇගැයීම සඳහා පාදක වන දෙවන අංශය වේ.

සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී ම හඳුන්වාදෙනු ලබන නිර්ණායක සහ තක්සේරුකරණයට හා ඇගැයීමට යොදාගත හැකි වේ. මින් පළමු නිර්ණායක තුන දැනුම, ආකල්ප හා කුශලතා ඇගයීමට වෙන් වී ඇති අතර අනෙකුත් නිර්ණායක දෙක යහපත් ජීවන පුරුදු සිසුන් තුළ වර්ධනය කිරීමේ අරමුණින් හඳුන්වා දී තිබේ.

වර්ෂය තුළ නිම කළ යුතු පාසල් පාදක ඇගැයීම් වාර ගණන නවයකි. සිසුන් ඉගැනුමෙහි යෙදෙන අතරතුර කැරෙන ඇගයීමට අමතර ව තෝරාගත් ලක්ෂණයන් හයක දී මෙම ඇගැයීම් ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායි වේ. ඒ ඒ ලක්ෂ්‍යය සඳහා ගැළපෙන ඇගැයීම් උපකරණ කල් තබා සකස් කරගෙන තිබීම මෙහි දී වැදගත් වේ.

ප්‍රවීණතාව ලබාගැනීම මට්ටම් කිහිපයක් ඔස්සේ සිදු වන බැවින් විෂයයක ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක් ඉක්මවා ලකුණු ලබාගැනීම අවශ්‍ය වේ. ලකුණු 60-80 දක්වා සීමාව ආසන්න ප්‍රවීණතා මට්ටම ලෙසත් ලකුණු 60 ට අඩු සීමාව ප්‍රවීණතාව නැති මට්ටම ලෙසත් සලකනු ලැබේ. මේ කරුණු පහත සඳහන් ආකාරයෙන් වගු ගත කළ හැකි වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒ අනුව ලකුණු | 0 | - | 60 | - | ප්‍රවීණතාව නැත |
| ලකුණු | 61 | - | 80 | - | ආසන්න ප්‍රවීණතාව |
| ලකුණු | 81 | - | 100 | - | ප්‍රවීණතාව |

සේ සැලැකිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 6 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව විෂය නිර්දේශය

| නිපුණතාව හා නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 01. අත්දැකීම් අනුකරණය, රස විඳීම හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරයි. | | 20 |
| 1.1 මුල, මැද,අග සහිත තමන් දන්නා ජනකතා කථනයෙන් ඉදිරිපත් කරයි. | 1.1 මුල, මැද,අග සහිත තමන් දන්නා ජනකතා කථනයෙන් ඉදිරිපත් කිරීම.<br>1.2 පරිසරය ආශ්‍රිත ව | |
| 1.2 ස්වභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරින් අනුකරණයට යොමු වෙයි. | 1.2.1 ස්වභාවික පරිසරය ආශ්‍රිත සංසිද්ධීන් ඇසුරින් අනුකරණය කිරීම.<br>ස්වාභාවික ලෝකය (ගස් වැල්, අහස, පොළොව, මුහුද, ගංගා,ඇළදොළ, වැස්ස, සුළඟ, හිරු, සඳු) | |
| 1.3 පන්ති කාමරය තුළ හා ඉන් බැහැර දී කතාන්දර කියවා වාචික ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසයි. | | |
| 1.4 මිනිස් ලෝකය තුළ දකින බාහිර චලන ඉරියව් හා හැඬතල අනුකරණය කරයි. | 1.2.2 මිනිස් ලෝකය තුළ දකින බාහිර චලන ඉරියව් හා හැඬතල අනුකරණය කිරීම. | |
| 1.5 සත්ත්ව ලෝකය තුළ දකින බාහිර චලන,ඉරියව් හා හැඬතල අනුකරණය කරයි. | 1.2.3 සත්ත්ව ලෝකය තුළ දකින බාහිර චලන , ඉරියව් , හැඬතල අනුකරණය කිරීම.<br>1.3 ජනකථා ආශ්‍රිත ව<br>1.3.1 පන්ති කාමරය තුළ හා ඉන් බැහැර දී කතාන්දර කියවා ප්‍රකාශනාත්මකව ඉදිරිපත් කිරීමට අවස්ථාවන් සැලසීම.<br>1.4 රසවින්දනය<br>1.4.1 කවි සින්දු ආදිය ශ්‍රවණය කිරීම, තාල තැබීම, ගීතයකට අනුව රංගනය කිරීම, තාලයකට අනුව රංගනය කිරීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 02. නාට්‍යමය ක්‍රියාකාරකම්හි නිරත වෙමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.<br><br>2.1 අත්දැකීම් පරිකල්පනය කිරීමේ ශක්තීන් පුබුදුවා නිර්මාණකරණයට යොමු වෙයි.<br>2.2 පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි ඇසුරින් නිර්මාණාත්මක රංගන ක්‍රියා ගොඩනගයි.<br>2.3 තනි තනි ව නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2.4 සාමූහික ව නිර්මාණාත්මක රංගනයන්හි යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2.5 සතුන් පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.<br>2.6 මිනිසුන් පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.<br>2.7 ද්‍රව්‍ය පාදකකොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.<br>2.8 අවස්ථා පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදෙයි.<br>2.9 පරිකල්පන ශක්තීන් පුබුදුවීමට විවිධ නිර්මාණ කාර්යයන්හි යෙදෙයි.<br>2.10අත්දැකීම් ඇසුරු කොට සාමූහික ව කතාන්දර ගොතයි.<br>2.11ජනකතා ඇසුරෙන් පරිකල්පන ශක්තීන් පුබුදුවා නිර්මාණකරණයට යොමු වෙයි.<br>2.12අපතේ යන ද්‍රව්‍ය හා ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණ කරයි. | 2.1 නිර්මාණාත්මක රංගනය<br>2.1.1 පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි ඇසුරින් නිර්මාණාත්මක රංගන ක්‍රියා ගොඩනැඟීම.<br>2.1.2 තනිතනි ව අනුකරණය කර දැක්වීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම<br>2.2 නිර්මාණාත්මක ක්‍රියාකාරකම්<br>▪ ක්ෂණික නිරූපණ (සත්ත්ව, මිනිස්, ද්‍රව්‍ය, අවස්ථා, පාදක කොට.)<br>2.2.1 සත්ත්ව චරිත පාදකකොටගෙන ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>2.2.2 මිනිස් භූමිකා පාදක කොටගෙන ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>2.2.3 ද්‍රව්‍ය පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදීම.<br>2.2.4 අවස්ථා පාදක කොටගෙන ක්ෂණික නිරූපණවල යෙදීම.<br>2.2.5 පරිකල්පන ශක්තීන් පුබුදුවීමට විවිධ නිර්මාණ කාර්යයන්හි යෙදීම.<br>2.2.6 අත්දැකීම් ඇසුරු කොට සාමූහික ව කතාන්දර ගෙතීම.<br>2.2.7 ජනකතා ඇසුරින් පරිකල්පන ශක්තීන් පුබුදුවා නිර්මාණකරණයට යොමු වීම.<br>2..2.8 සරල වෙස්මුහුණු නිර්මාණය<br>2.2.8.1 අපතේ යන ද්‍රව්‍ය හා ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණ කිරීම. | 30 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 2.13 ජනකථා ඇසුරෙන් රංගන අවස්ථා ගොඩනගයි.<br><br>03. ප්‍රායෝගික ක්‍රියාකරකම්හි නිරත වෙමින් අදාළ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.<br><br>3.1 පැහැදිළි ව අදහස් ප්‍රකාශනය හා අවබෝධයෙන් යුතු ව සංවාදයේ යෙදෙයි. (තෝරා ගත් නාට්‍ය පෙළ ඇසුරින්)<br>3.2 ඒ ඒ චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදෙයි. | • අපතේ යන ද්‍රව්‍ය - කඩදාසි, කාඩ්බෝඩ් ආදී<br>• ස්වභාවික ද්‍රව්‍ය - කොළපත්, රම්ගෙඩි,ලබුකැට,ගොක් කොළ වැනි විවිධ කොළ වර්ග, විවිධ ඇට වර්ග හා ගෙඩි වර්ග<br>2.2.9 සරල නාට්‍යෝපකරණ නිර්මාණය<br>2.2.9.1 රංගෝචිත උපකරණ නිර්මාණය කිරීම.<br>උදා:උපැස්, කඩු,මකුට,(හිස් පළඳනා)පාවහන්,මාල, වළලු.<br>2.2.10 රංගන අවස්ථා ගොඩනැගීම.<br>2.2.10.1 ජනකථා ඇසුරෙන් රංගන අවස්ථාගොඩනැගීම. (ඒකල හා සාමූහික)<br><br>3. ප්‍රායෝගික ක්‍රියාකරකම්හි නිරත වෙමින් අදාළ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය ප්‍රකට කිරීම.<br>3.1 අභ්‍යාස<br>3.1.1 මනස හා ශරීරය අතර සම්බන්ධතාව සරල ව හඳුනාගැනීම සඳහා සංචලන විධි භාවිත කිරීම. (හිතන දේ හා කරන දේ අතර සම්බන්ධය)<br>3.1.2 සංවාද හැසිරවීම හා නාද අනුකරණය කිරීම. | 25 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 3.3 මනස හා ශරීරය අතර සම්බන්ධතාව සරල ව හඳුනාගැනීම සඳහා සංචලන විධි භාවිත කරයි.<br><br>3.4 විවිධ ස්වර හා තාලවලට අනුව සංවාද භාවිතා කරයි.<br><br>3.5 විවිධ හැඟීම් හා අවස්ථාවන්ට උචිත පරිදි සංවාද හා දෙබස් භාවිතා කරයි.<br><br>3.6 ජනක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදෙයි. | 3.1.2.1 සංවාද භාවිතයේ දී විවිධ ස්වරූප හා තාලවලට අනුව කටහඬ යොදා ගැනීම.<br><br>3.1.2.2 විවිධ හැඟීම් සහ අවස්ථාවන්ට උචිත පරිදි සංවාද හා ශබ්ද භාවිත කිරීම.<br>උදා:<br>❖ රබන් පද,<br>❖ අශ්ව කුර හඬ<br>❖ සතුන් ගේ හඬවල්<br><br>3.2 ක්‍රීඩා ආශ්‍රිත ක්‍රියාකාරකම්<br><br>3.2.1 ජන ක්‍රීඩා ඇසුරින් සිසුන් සාමූහික රංගනයේ යෙදීම<br>උදා: එළුවන් කැම ආදි ජන ක්‍රීඩාවල යෙදීම<br><br>3.3 පැහැදිළි ව අදහස් ප්‍රකාශනය හා අවබෝධයෙන් යුතු ව සංවාදයේ යෙදීම (තෝරාගත් නාට්‍ය පෙළ (ඇසුරෙන්)<br>1. පුංචි අපට දැන් තේරෙයි. (සෝමලතා සුබසිංහ)<br>2. අමර ගියා දිව්‍ය ලෝකෙ (පාලිත ලොකුපෝතාගම)<br><br>3.4 ඒ ඒ චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම් හි යෙදීම. | 15 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 04. නාට්‍ය හා රංග කලාවට අදාළ සංස්කෘතික හා සාමාජික වටපිටාව ගවේෂණය කරයි.<br><br>4.1 ජන සාහිත්‍යයේ එන සරල කතා හා ඒවායේ වටපිටාව පිළිබඳ අධ්‍යයනය කරයි.<br><br>4.2 ජනකථා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වෙයි.<br><br>4.3 ජනකථා, උපමාකථා ආදියෙහි එන සාමාජික හා සංස්කෘතික ලක්ෂණ විමසයි. | 4. නාට්‍ය හා රංග කලාවට අදාළ සංස්කෘතික හා සාමාජික වටපිටාව අධ්‍යයනය කිරීම.<br><br>4.1 ජනකථා, උපමාකථා ආදියෙහි එන සමාජයීය හා සංස්කෘතික ලක්ෂණ විමසීම.(ශිෂ්‍යයා දන්නා කතාන්දරවල නිරූපිත සමාජ හා සංස්කෘතික ලක්ෂණ හා චර්යා අවබෝධ කිරීමට යොමු කිරීම මින් අදහස් කෙරේ.)<br>උදා:- ආඬිහත්දෙනා ගේ කැඳහැලිය පුහුල් හොරා කරෙන් දැනේ ඊසොප් ගේ උපමා කතා<br><br>4.2 ජන සාහිත්‍යයේ එන කතා රැස්කිරීම.<br><br>4.3 ජන කතා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>නාට්‍ය හා රංග කලාව</u>

<u>6/10 ශ්‍රේණි සඳහා - විෂය නිර්දේශ කමිටුව</u>

මෙහෙයවීම :

මහාචාර්ය ජේ.ඩබ්.වික්‍රමසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

අධීක්ෂණය :

විමල් සියඹලාගොඩ මහතා - සහකාර අධ්‍යක්ෂ ජනරාල් , ජාතික අධ්‍යාපන ආයතනය.

උපදෙස් :-

සුදත් සමරසිංහ මහතා - අධ්‍යක්ෂ, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

විෂය නිර්දේශ විශේෂඥ උපදෙස් :

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය කේ.සිවතම්බි මහතා - යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා - කොළඹ විශ්ව විද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය - කැළණිය විශ්ව විද්‍යාලය

විජේරත්න පතිරාජ මහතා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (විශ්‍රාමික), ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය නිර්දේශ සැකසුම් කමිටුව :

ඩී.එම්.පත්මා කුමාරි මිය - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (නාට්‍ය), ජාතික අධ්‍යාපන ආයතනය.

කේ. ජී. අජිත් රූපසේන මහතා - ව්‍යාපෘති නිලධාරී (නාට්‍ය) ජාතික අධ්‍යාපන ආයතනය.

ක්ලයිව් ශාන්ත මහතා - ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල.

පාලිත ලොකුපෝතාගම මහතා - ගුරු සේවය, වික්‍රමශිලා ම.ම.වි., ගිරිඋල්ල.

ලලිතා ජයරත්න මිය - ගුරු සේවය, මාදම්පේ විජය මහා විද්‍යාලය, අටකලම්පන්න,

පී.ඩී.ස්වර්ණලතා මිය - ගුරු සේවය, පෝද්දිවෙල මහා විද්‍යාලය, ඇල්පිටිය.

ජී.කරුණාවතී මිය - ගුරු සේවය, එම්.ඩී.එච්.ජයවර්ධන මහා විද්‍යාලය, බත්තරමුල්ල.

ව්‍යාපෘති කණ්ඩායම් නායක :

කේ. ජී. අජිත් රූපසේන මහතා - ව්‍යාපෘති නිලධාරී (නාට්‍ය) ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.